සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.

(ii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(01) ''ස්වාමීන් වහන්සේගේ වචනය සදහටම පවතියි. මේ වචනය නම් ඔබට දේශනා කරන ලද සුබ අස්නය'' මෙසේ ප්‍රකාශ කළේ,

(1) ශුද්ධ වූ පාවුලුතුමා ය. (2) ශුද්ධ වූ පේදුරු තුමා ය.
(3) ශුද්ධ වූ ජාකොබ්තුමා ය. (4) ශුද්ධ වූ ජුවාම්තුමා ය.

(02) ශුද්ධ වූ පාවුලුතුමා සිරගතව සිටින විට ක්‍රිස්තු භක්තිකයින්ගේ විශ්වාසය ස්ථිරව සිටින ලෙස දන්වා යැවූ ලිපිය වන්නේ,

(1) කොලොස්සි ලිපිය (2) පිලෙමොන් ලිපිය
(3) පිලිප්පි ලිපිය (4) ගලාති ලිපිය

(03) අපගේ ජීවිතයෙහි හමුවන බාධක, ගැටලු වලට ඉවසීමෙන් මුහුණ දිය හැකි නම් අවසානයේ දී අපට ලබාගත හැක්කේ,

(1) තාවකාලික සැපත (2) සදාකාලික සැපත
(3) සෞභාග්‍ය සැපත (4) ස්වර්ගීය සැපත

(04) ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ වන්නේ,

A ගීතාවලිය
B වීරාවලිය
C 2 රාජාවලිය
D ප්‍රේම ගී

මින් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

(1) A හා D ය. (2) B හා C ය. (3) C හා D ය. (4) A හා C ය.

(05) ශුද්ධ බයිබලයේ නව අහසත් හා නව පොළොවක් ගැන සඳහන් කරන ග්‍රන්ථය වන්නේ,

(1) උත්පත්ති පොතේ ය. (2) එළිදරව් සාහිත්‍යයේ ය.
(3) ද්විතීය නීති සංග්‍රහයේ ය. (4) රෝම ලිපියේ ය.

(06) ශුද්ධ වූ පේදුරුතුමාගේ ප්‍රථම දේශනයේ අඩංගු කරුණකි.

(1) විජාතික කොරනේලියස් ඇතුලු පවුලේ අය බෞතීස්මය ලැබූහ.

(2) පේදුරුතුමාගේ දේශන අසා බෞතීස්ම ලැබූ ගණන 5000ට පමණ විය.

(3) දෙවියන් වහන්සේගේ වම් පසෙහි ජේසුස් වහන්සේ වැඩ සිටින සේක.

(4) ජෙරුසලමේ වැසියන් අන්‍ය භාෂාවලින් කථා කිරීම

(07) මීසම් සංඝයේ සියලු දෙනා සමගිව කටයුතු කරන අතර අන් කිතුනු සභා සමඟ සමඟියෙන් හා සහයෝගයෙන් කටයුතු කරයි. මෙය හඳුන්වනු ලබන්නේ,

(1) කතෝලිකත්වයයි.

(2) අපොස්තලිකත්වයයි.

(3) සාධාරණත්වයයි.

(4) එකත්වයයි.

(08) පහත සඳහන් වගන්තිවලින් කියවෙන පුද්ගලයා වන්නේ,

- හිස් පතුළින් සේවයට කැප වූ මෙතුමා පා ගමනින් යාමට පුරුදු විය.
- ඉතා අල්පේච්ඡ දිවියක් ගත කළ අතර ආදර්ශමත් සේවයක් ඉටු කළේ ය.
- අන්නවි, මුහුප්පු, සත්ක්‍රිස්තියන් යනා දී ගිහි නායකයන් පත් කෙරිණි.
- මෙතුමා විවිධ පලාත්වල ඉතා දුෂ්කර සේවයක නියැලුණි.

(1) ගරු මයිකල් රුදිගු පියතුමා

(2) ශුද්ධ වූ මැක්ෂිමිලියන් කොල්බේ මුනිතුමා

(3) ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමා

(4) අති උතුම් තෝමස් කාදිනල් කුරේ හිමිතුමන්

(09) ජේසුස් වහන්සේ මහ බ්‍රහස්පතින්දා දින දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීම පිළිබඳ සඳහන් කරන සුවිශේෂිකවරු වන්නේ,

(1) ශුද්ධ වූ මතෙව් හා ජොහාන්තුමා ය.

(2) ශුද්ධ වූ මතෙව්, මාක් හා ජොහන්තුමන් ය.

(3) ශුද්ධ වූ මතෙව්, මාක් හා ලූක් තුමා ය.

(4) ශුද්ධ වූ මාක්, ලූක් හා ජොහන්තුමා ය.

(10) ''මට ගෙයක් දෙන්න, මැරෙන්න වැටී සිටින අයව මං බලා ගන්නම්'' මෙය කා විසින් කා හට පවසන ලද්දක් ද?

(1) ශුද්ධ වූ මැක්ෂිමිලියන් කොල්බේ මුනිතුමා විසින් නාසිවරුන්ට

(2) ශුද්ධ වූ තෙරේසා මුනිතුමිය විසින් ප්‍රාදේශීය නායකයන්

(3) ගරු මයිකල් රුදිගු පියතුමා විසින් සභා නායකයන්ට

(4) ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමා විසින් රජතුමාට

(11) ''මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න'' ක්‍රිස්තුන් වහන්සේ මෙසේ ප්‍රකාශ කළේ,

(1) අන්තිම රාත්‍රී භෝජන අවස්ථාවේ දී ය.

(2) ශ්‍රාවකයන්ට දර්ශනය වූ අවස්ථාවේ දී ය.

(3) කුරුසපත් වූ අවස්ථාවේ දී ය.

(4) උත්ථාන වූ අවස්ථාවේ දී ය.

(12) දෙවි පියාණන්ගේ මහිමය ප්‍රකාශ කරමින් ක්‍රිස්තුන් වහන්සේ කළ උතුම් යාච්ඤාව වනුයේ,

(1) ඔලිව් කන්දේ යාච්ඥාව (2) පාළුකරයේ යාච්ඥාව

(3) ගෙත්සෙමෙන් උයනේ යාච්ඤාව (4) උත්තම පූජක යාච්ඤාව

(13) සියදිවි නසා ගැනීම තුළින් යමෙක් කරන බරපතල ම වරද කරනුයේ,

(1) තමාගේ මිතුරු මිතුරියන්ට ය.

(2) තම පවුලේ නෑදෑයන්ට ය.

(3) තමා ජීවත් වන මිනිස් සමාජයට ය.

(4) ජීවිතයේ අධිපතියාණන් වූ මහෝත්තම වූ දෙවියන් වහන්සේට ය.

(14) සාමාන්‍ය සමය තුළ පවත්වන මංගල්‍යයන් වන්නේ,

A දේව මෑණියන්ගේ මංගල්‍යය

B ශුද්ධ වූ ත්‍රිත්ව මංගල්‍යය

C සාන්තුවරයන්ගේ මංගල්‍යය

D දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යය

මින් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

(1) A හා D ය. (2) A හා C ය. (3) C හා D ය. (4) B හා C ය.

(15) ඇතුළුවීමේ ගීතිකාව ගායනා කිරීමෙන් ප්‍රකාශ වන්නේ,

(1) දේව ජනතාවගේ භක්තිවන්තකම (2) දේව ජනතාවගේ විශ්වාසන්තකම

(3) දේව ජනතාවගේ එකමුතුකම (4) දේව ජනතාවගේ පශ්චාත්තාපිත බවයි.

(16) පඬුරු පෙරහැරේ ගෙන එනු ලබන පඬුරුවලින් පුදසුන මත තබන්නේ,

(1) පූප හා මිදි යුෂ (2) මිදි යුෂ හා එළවළු

(3) පූප හා පලතුරු (4) වියළි ආහාර හා ඉටිපහන්

(17) ශුද්ධ වූ දින තුන ලෙස හඳුන්වන්නේ,

(1) ශොබ් ඉරිදා / මහ බ්‍රහස්පතින්දා / මහ සිකුරාදා

(2) මහ බ්‍රහස්පතින්දා / මහ සිකුරාදා / ආලේලූයියා සෙනසුරාදා

(3) මහ බ්‍රහස්පතින්දා / මහ සිකුරාදා / පාස්කු ඉරිදා

(4) අළු බදාදා / මහ සිකුරාදා / පාස්කු ඉරිදා

(18) පැවිදි නිකායන් කොටස් දෙක වන්නේ,

(1) පැවිදි සොහොයුරන් හා පැවිදි සොහොයුරියන්

(2) පදවි පූජකයන් හා පැවිදි පූජකයන්

(3) පැවිදි පූජක හා පූජක නොවන පැවිදි අය

(4) පැවිදි සොහොයුරන් හා පදවි පූජකයන්

(19) අවශ්‍යතාවයෙන් පෙළෙන්නන් හට උදවු උපකාර කළ යුතු බව පැවසුවේ,

(1) ශුද්ධ වූ ජොන් ක්‍රිසොස්තම් තුමා ය. (2) ශුද්ධ වූ ජෙරොම්තුමා ය.

(3) ශුද්ධ වූ පේදුරුතුමා ය. (4) ශුද්ධ වූ බැසිල් තුමාය

(20) දෙවන දේව පනතට විරුද්ධ ක්‍රියා වන්නේ,

A දේව වචනය අගෞරව ලෙස භාවිතා කිරීම

B විද්‍යාව අනුව දේවත්වය මිත්‍යාවන් යැයි සිතීම

C කිතුනුකමට සාක්ෂි නොදැරීම

D දේව ආදරය මෙනෙහි නොකිරීම

මින් නිවැරදි පිළිතුර වන්නේ,

(1) A, B හා C ය. (2) B, C හා Dය. (3) B හා D ය. (4) A හා C ය.

(21) ''ෂමාර්''යන හෙබ්‍රෙව් වචනයේ අර්ථය වන්නේ,

(1) වගාකිරීම (2) වැඩ කරමින් නිර්මාණය කිරීම

(3) පාලනය කිරීම (4) සංරක්ෂණය කිරීම

(22) ආත්මික පුන්‍ය ක්‍රියාවක් වන්නේ,

(1) රෝගීන් බලන්නට යාම (2) වහලුන් නිදහස් කිරීම

(3) අඥානයන්ට ඉගැන්වීම (4) මළවුන් වැළලීම

(23) පාස්කු සමය තුළ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීම ගැන අපට උගන්වන්නේ,

(1) ශුද්ධ වූ සභාවේ දෙවන ශික්ෂා පදයෙනි.

(2) ශුද්ධ වූ සභාවේ තුන්වන ශික්ෂා පදයෙනි.

(3) ශුද්ධ වූ සභාවේ හතරවන ශික්ෂා පදයෙනි.

(4) ශුද්ධ වූ සභාවේ පළමුවන ශික්ෂා පදයෙනි.

(24) ස්වර්ගාරෝපණය යන්නෙහි අර්ථය වන්නේ,

(1) තවත් කෙනෙකු විසින් ස්වර්ගයට ඔසවා ගැනීමයි.

(2) තමන්ගේ උත්සහයෙන් ම ස්වර්ගය කරා ගමන් කිරීමයි.

(3) ජන්ම පාපයෙන් නිදොස්ව මෙලොවට ඉපදීමයි.

(4) ආත්ම ශරීර පිටින් සුරලොවට වැඩම කිරීමයි.

(25) ක්‍රි. ව. 1858 පෙබරවාරි 11 වන දින ප්‍රංශයේ ලූර්දු නුවර දේව මාතාවන් දර්ශනය වූයේ කාට ද?

(1) ශුද්ධ වූ තෙරේසා මව්තුමියට (2) ලූසී හා ජසින්තා යන ළමුන්ට

(3) බර්ණදෙත්තුමියට (4) කිරි වෙළදාමේ යන පිරිමි දරුවෙකුට

(26) විවාහය දේව ප්‍රසාද නිධානයක් බවට පත් වීමට අවශ්‍ය කරුණු වන්නේ,

A වයස අවුරුදු 18 සම්පූර්ණ වී විවාහය සිදුවීම

B ප්‍රසාද ස්නාපනය ලැබූ දෙදෙනකු අතර විවාහය සිදුවීම

C දේවස්ථානයේ කතෝලික ආගමික පූජකවරයෙකු ඉදිරියේ විවාහය සිදුවීම

D දෙමාපියන්ගේ කැමැත්ත ඇතිව විවාහය සිදුවීම

වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

(1) B, C හා D ය. (2) B හා Dය. (3) A, B හා C ය. (4) B හා C ය.

(27) පදවි පූජක පොරොන්දු දෙක වන්නේ,

(1) දිළිඳුකම / කීකරුකම (2) කීකරුකම / පූජක බඹසරය

(3) ව්‍රත ශුද්ධිය / පූජක බඹසරය (4) ව්‍රත ශුද්ධිය / කීකරුකම

(28) සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය හා රෝගීන් ආලේප කිරීමේ දේව ප්‍රසාද නිධාන හඳුන්වන්නේ,

(1) ආරම්භක දේව ප්‍රසාද නිධාන ලෙස ය.

(2) සුවය දානයේ දේව ප්‍රසාද නිධාන ලෙස ය.

(3) එකවරක් පමණක් ලබාගත හැකි දේව ප්‍රසාද නිධාන ලේස ය.

(4) ජනතා සේවයේ දේව ප්‍රසාද නිධාන ලෙස ය.

(29) පෞද්ගලික දේපල පරිහරණය කළ යුතු ආකාරය පිළිබඳව ආගම ගුරුහවතා ඉගැන්වීය. ඒ අනුව පිළිපැදිය යුතු දේව පනත් වන්නේ,

(1) 7 හා 9 දේව පනත් ය. (2) 4 හා 8 දේව පනත් ය.

(3) 7 හා 10 දේව පනත් ය. (4) 5 හා 10 දේව පනත් ය.

(30) '<u>**බැහැ සිතින් දෙව් සරණ පතන්නෝ**</u> භාග්‍යවන්තයෝ ය' ඉරි ඇඳි පදයෙන් හඳුන්වා දෙන්නේ,

(1) සියල්ලේ දී දෙවියන් වහන්සේ වෙත රැඳී සිටින අය ය.

(2) අයහපත් ගති ගුණ වලින් ඉවත් වූ අය ය.

(3) දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් යාච්ඤා කරන අය ය.

(4) නීතිය හා සාමය රකින අය ය.

(31) ඉරුදින දිව්‍ය පූජාවේ දේශනයට සවන් දීමේ වැදගත්කම අපට තහවුරු කරන උපමාව වන්නේ,

(1) තලෙන්තු පිළිබඳ උපමාව (2) කිරිදි පිළිබඳ උපමාව

(3) නිධානය පිළිබඳ උපමාව (4) වපුරන්නා පිළිබඳ උපමාව

(32) සුපුවත් ග්‍රන්ථයක් ලියූ එකම අන්‍ය ජාතික සුවිශේෂ වරයා වන්නේ,

(1) ශුද්ධ වූ ජොහාන්තුමා ය. (2) ශුද්ධ වූ ලූක් තුමා ය.

(3) ශුද්ධ වූ මතෙව් තුමා ය. (4) ශුද්ධ වූ මාක් තුමා ය.

(33) තේවාචාරි තුමකුගේ කාර්යයන් පහත දැක්වේ.

1 දේව වාක්‍ය දේශනා කිරීම

2 ප්‍රසාද ස්නාපනය දානය කිරීම

3 විවාහ පිළිවෙත් සිදු කිරීම

4 දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය දානය කිරීම

(1) 1 හා 2 නිවැරදි ය. (2) 1, 2 හා 4 නිවැරදි ය.

(3) 2, 3 හා 4 නිවැරදි ය. (4) ඉහත සියල්ල ම නිවැරදි ය.

(34) ''එම්බා පොළොන් වංශය එන්න තිබෙන උදහසින් පලා යන්නට නුඹලාට අවවාද කළේ කවරෙක් ද? මෙය කා විසින් කා හට පවසන ලද්දක් ද?

(1) ජේසුස් වහන්සේ විසින් පරිසිවරුන්ට (2) ශුද්ධ වූ පාවුලුතුමා තොරෙන්තිවරුන්ට

(3) ස්නාවක ජුවාම්තුමා විසින් ප්‍රභූ ජනතාවට (4) පූජකවරුන් විසින් ජුදා ජනතාවට

(35) 'ස්ත්‍රිය රුචියට වහල් වී වැරදි තීරණ ගැනීමෙන් අපට ලැබෙන පණිවිඩය වන්නේ,

A රුචියට වහල් වී වැරදි තීරණ ගැනීම නුසුදුසු බව

B අප තීරණ ගැනීමේ දී හවර් ද සාක්ෂියට සවන් දී එයට අවනත විය යුතු බව

C ප්‍රශ්න වලට පිළිතුරු දීමේ දී වරද අනුන් මත පැටවිය යුතු බව

D දේව අභිමතයට පූර්ණ නිදහසින් අවනත විය යුතු බව

(1) A, B හා D ය. (2) B, C හා Dය. (3) A, C හා D ය. (4) A, B හා C ය.

(36) ''මව්කුසේ පිළිසිඳ ගැනීම ඇති කරන්නට පෙර පටන් සමිදාණන් වහන්සේ කැඳ වූ දිවැසිවරයා වන්නේ,

(1) එසකියෙල් දිවැසිවරයා ය. (2) ජෙරමියා දිවැසිවරයා ය.

(3) දානියෙල් දිවැසිවරයා ය. (4) යෙසායා දිවැසිවරයා ය.

(37) ශුද්ධ බයිබලයේ හේබ්‍රෙව් හා ග්‍රීක පිටපත හඳුන්වන නම් වන්නේ,

(1) මැසොරෙටික් හා සෙප්ටුවාජින්ත (2) වල්ගේට් හා මැසොරෙටික්

(3) වල්ගේට් හා සෙප්ටුවාජින්ත (4) රොසෝරියම් හා මිස්ටෙරියුම්

(38) දෙවියන් වහන්සේ මිනිසාට ඉතා සමීප සම්බන්ධතාවක් දක් වූ බව මානවරූපී ශෛලයකින් ඉදිරිපත් කරන්නේ,

(1) එලොහිම් සම්ප්‍රදායේ ය. (2) ද්විතීය නීති සම්ප්‍රදායේ ය.

(3) පූජක සම්ප්‍රදායේ ය. (4) යාවේ සම්ප්‍රදායේ ය.

(39) පහත කරුණු ගැන අවධානය යොමු කරන්න.

- ශුභාරංචිය ගෙන යමින් ධර්ම දානයේ යෙදීම
- නිවෙස් බැහැදැකීම හා අවභ්‍යතා සොයා බැලීම
- බාලයන්ට ඉගැන්වීම
- ආරෝග්‍යශාලා බැහැදැකීම හා රෝගීන් හමුවීම

ඉහත කරුණුවලින් කියවෙන ගිහි ධර්මදූත සේවාවක් වන්නේ,

(1) මරිය හමුදාව (2) දිව්‍ය හාද සමිතිය

(3) සාන්ත වින්සන්ද පාවුලා සමිතිය (4) දේව මාතා දරු සමාගම

(40) පහත සඳහන් දිවැසිවරු අතරින් සුළු දිවැසිවරු වන්නේ,

(1) නාතාන් හා එළියා ය. (2) එළිෂා හා මීකායා ය.

(3) ආමොස් හා හොසියා ය. (4) නාතාන් හා

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

**වර්ෂ අවසාන ඇගයීම**
**ஆண்டிறுதி மதிப்பீடு - 2018**
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

**සැලකිය යුතුයි:**

(i) පළමුවන ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) අනිවාර්යය ප්‍රශ්නය

(1) පළමුවන හා දෙවන මැවීමේ කථාපුවත් අයත් සම්ප්‍රදායන් දෙක පිළිවෙළින් නම් කරන්න.

(2) කිතුනු සභා බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

(3) එළිදරව් සාහිත්‍යයේ එන සංකේත වර්ග දෙක නම් කරන්න.

(4) ජන වන්දනා වසරේ දම් වර්ණය භාවිතා කරන කාල වකවානු දෙක නම් කරන්න.

(5) ඊශ්‍රායෙල් ජනතාවගේ වර්ධනය මර්ධනය කිරීමට ඊශ්‍රායෙල් ජනතාව ලවා ඉදිකළ ගබඩා නගර දෙක නම් කරන්න.

(6) කිතුනු විවාහයේ පරමාර්ථ දෙක නම් කරන්න.

(7) දෙවන ලෝක යුද්ධයෙන් පසු භාවනා සඳහා අවදි වූ නිකායන් දෙක නම් කරන්න.

(8) ශුද්ධ වූ පාවුලුතුමා සීලස් සමග දෙවන ධර්මදූත චාරිකාව ඇරඹූ පසු එම ගමනට පසුව සහභාගි වූ දෙදෙනා නම් කරන්න.

(9) බලාපොරොත්තුවට විරුද්ධ පාපයන් දෙක නම් කරන්න.

(10) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට අප සූදානම් විය යුතු ආකාර දෙක ලියන්න.

(ලකුණු 2 × 10 = 20)

(02) (1) පූජා ප්‍රසාදිවරු කොටස් දෙක නම් කරන්න.

(2) පූජා ප්‍රසාදිවරයකුගේ වගකීම් තුනක් ලියන්න.

(3) පූජා ප්‍රසාදින් වහන්සේලා වෙනුවෙන් ඔබට කළ හැකි කාර්යයන් පහක් ලියා විස්තර කරන්න.

(03) (1) අපගේ ජීවිතයේ අයිතිය ඇත්තේ දෙවියන් වහන්සේට උන් වහන්සේ ජෙරමියා දිවැසිවරයාට (ජෙරමියා 1:4-5) ප්‍රකාශ කරන්නේ කුමක් ද?

(2) මිනීමරණ අය යටත් වන විනිශ්චි මාර්ග තුන ලියා දක්වන්න.

(3) ''මිනිස් ජීවිත සුරැකීම කිතුනු අපගේ යුතුකමකි'' වත්මන් සමාජය තුළ ගබ්සාවට එරෙහිව හඬක් නගන්නේ කෙසේදැයි කරුණු පහකින් විස්තර කරන්න.

(04) (1) ස්වාමිවාක් ආරාධනාව සඳහන් වන ශුභාරංචි දෙක නම් කරන්න.

(2) උත්තම පූජක යාච්ඤාවේ කොටස් තුන ලියන්න.

(3) දුර්පරීක්ෂා වලින් ජය ගැනීමට අවශ්‍ය ශක්තිය ඉල්ලා සුදුසු යැදුම් ස්වාමිවාක් ආරාධනාවේ ලක්ෂණ වලට අනුව වචන 50කින් පමණ නිර්මාණය කරන්න.

(05) (1) ජේසුස් වහන්සේ පේදුරුතුමාට තමා අනුගාමී වන්නට ආරාධනා කරමින් ප්‍රකාශ කළ වචන මොනවා ද?

(2) ජේසුස් වහන්සේ පේදුරුතුමාට පැවරූ තුන් ප්‍රකාර කාර්ය භාරය කුමක් ද?

(3) අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමාගේ ජීවිතයෙන් ඔබට ගත හැකි ආදර්ශයන් පහක් ලියා විස්තර කරන්න.

(06) (1) හැත්තෑදෙනාගේ ධර්මදූත මෙහෙය සංකේතවත් කරන්නේ කුමක් ද?

(2) හැත්තෑ දෙනා ධර්මදූත කාර්යය සඳහා පිටත් කර යැවීමේ දී ක්‍රිස්තුන් වහන්සේ දුන් උපදෙස් තුනක් ලියන්න.

(3) ගෝලයින්ට පැවරූ දූත කාර්යය පිළිබඳ වගකීම අද ශුද්ධ වූ සභාව තුළ ඔබට පැවරී ඇත. එම කාර්ය ඉටු කිරීමට ඔබට පාසලේ දී ගත හැකි ක්‍රියාමාර්ග පහක් ලියා විස්තර කරන්න.

(07) පහත සඳහන් මාතෘකා දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(1) ලන්චියානෝ නුවර ප්‍රාතිහාර්යය

(2) මයාදාව

(3) යෙසායා දිවැසිවරයාගේ කැඳවීම

(4) පාස්කු සමය